# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
## සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
## තනතුරු පුරප්පාඩු දැන්වීමයි

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|
| 01 | සහකාර සුබසාධක කොමසාරිස් (තොරතුරු තාක්ෂණ - මෙහෙයුම්)<br>MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරුකරණය හෝ තොරතුරු තාක්ෂණයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.<br>සමඟ<br>පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම. |
| 02 | උපකාරක මෙහෙයුම් ක්‍රියාකරු<br>MA-1-2 | 03 | I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය,<br>• සිංහල / දෙමළ<br>• ඉංග්‍රීසි<br>• ගණිතය<br>යන විෂයන් ඇතුළුව විෂයයන් 03කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් සමත්වීම<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය අවම වශයෙන් විෂයයන් තුනක් සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) |
| 03 | රියදුරු<br>PL-3 | 02 | I. සාමාන්‍ය පෙළ විෂයන් හයක් (06) සමත් වීම. (සා.පෙළ) විභාගය, අවම වශයෙන් වාර දෙකක (02) සාමාන්‍ය සාමාර්ථ සහිතව උපරිම වාර දෙකක.<br>සහ<br>බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබාගෙන තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබීම. |

**වයස :**

**සහකාර සුබසාධක කොමසාරිස් -** [අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.]

**උපකාරක මෙහෙයුම් ක්‍රියාකරු -** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි (උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ)

**රියදුරු -** [අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.]

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර ඉන් ලබාගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**බඳවාගැනීමේ කොන්දේසි :**

මෙම තනතුරු ස්ථිරය. තනතුර ස්ථිර කිරීමට පෙර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

**මාසික වැටුප :**

MM 1-1-2016 රු. [53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575] + රජයේ අනුමත වෙනත් දීමනා,
MA 1-2-2016 (රු. 27,910 - 10 x 300 - 7 x 350 - 12 x 600 - 12 x 710 - රු. 49,080/-) + රජයේ අනුමත වෙනත් දීමනා,
PL 3-2016 රු. [26,290 – 10 x 270 - 10 x 300 – 10 x 330 - 12 x 350 - 39,490] + රජයේ අනුමත වෙනත් දීමනා,
වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 12%ක් රජයේ දායක මුදල් ලෙස ගෙවනු ඇත. තවද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායක මුදලක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

ආදර්ශ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් බාගත කර ගත හැකිය.
https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
https://www.wbb.gov.lk/web/si/jobs

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.12.20 දින හෝ එදිනට පෙර **කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො. 191, ධර්මපාල මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. රජයේ / සංස්ථා වල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතනය වල ප්‍රධානීන් මාර්ගයෙන් යොමුකළ යුතුය. පමා වූ, අසම්පූර්ණ හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

තවද, **අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.** මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය සේ සැලකිය යුතුය.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**